# 10 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

## නාට්‍ය යනු කුමක්ද?





අන්තර්ගතය - S.M. විජිත බණ්ඩාර - ගුරු උපදේශක - දොම්පෙ අධ්‍යාපන කලාපය
සැකසුම - J.A.S.T ජයකොඩි - ර/ පුස්සැල්ල මහා විද්‍යාලය , පුස්සැල්ල

The National e-Learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# නාට්‍ය යනු කුමක්ද?

## 1.ග්‍රීක මතය




- ග්‍රීක වචන මගින් බිහි වූ සංකල්පයට අනුව නාට්‍ය යනු වේදිකාවක් මත සිදුකරන රංග කාර්යය යන්න හදුනාගත හැකිය.
- නාට්‍යයක් යනු ක්‍රියාවක් අනුකරණය කිරීමයි. (ඇරිස්ටෝටල්)

## 2.සංස්කෘත මතය

භරතමුණිවරයා නාට්‍ය ශාස්ත්‍රයේදී නාට්‍ය පිළිබඳ දෙන අර්ථ කථනය

↓

සුඛ දුක්ඛ ආදියෙන් සමන්විත ලෝක ස්වභාවය සතර අභිනය මගින් අනුකරණය කිරීම නාට්‍යයයි.







## 3.නිදහස් මතය

නාට්‍ය පෙළක් අධ්‍යක්ෂකවරයෙක් විසින් නළු නිළියන් යොදා අනුශාංගික ශිල්පීන්ගේ දායකත්වය ද සහිතව වේදිකාවක් මත ප්‍රේක්ෂකයා ඉදිරියේ සජීවීව ගෙන හැර දැක්වීම නාට්‍ය ලෙස හඳුන්වයි.



## නාට්‍ය කලාව බිහිවීම

- ප්‍රාග් ඓතිහාසික මානවයාට මුලින්ම සන්නිවේදනය සඳහා ශරීරය පදනම් අනුකරණය භාවිත කිරීම.
- ක්‍රමයෙන් ශබ්ද මත පදනම්ව භාෂාව නිර්මාණය වීම.
- භාෂාව මගින් සන්නිවේදනය පහසු වීම.
- එමගින් කතන්දර කලාව බිහිවීම.
- කතන්දරය කියවනවා වෙනුවට කර පෙන්වීම මගින් නාට්‍ය කලාව උපත ලැබීම.

